# රේගු නිවේදනයයි

## ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 09/2018

### 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

එස්. ආර්. ආටිගල
ලේකම්
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

2018 නොවැම්බර් මස ....15........... වැනි දින
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේදීය.

## 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

## ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2018 නොවැම්බර් මස ..16...... වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණිය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණිය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මහින්ද රාජපක්ෂ
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍ය

2018 නොවැම්බර් මස.....15.......වන දින
කොළඹ 01,
මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | තීරුබදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| 27.10 | | | අශුද්ධ තත්ත්වයේ හැර, පැට්‍රෝලියම් තෙල් වර්ග සහ ගල්කීලමය ඛනිජ වර්ගයන්ගෙන් ලබාගත් තෙල් වර්ග ; බරෙන් 70% කට නොඅඩුව පැට්‍රෝලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු, මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග ; වේස්ට් ඔයිල්. | | | |
| | | | | | | |
| | | | තෙල් වර්ග, බරෙන් 70% කට නොඅඩුව පැට්‍රෝලියම් තෙල් වර්ග හෝ ගල්කීලමය ඛනිජ ද්‍රව්‍යයන්ගෙන් ලබාගත් තෙල් වර්ග අඩංගු, මෙකී තෙල් වර්ග සංයෝජනවල මූලික සංඝටක ද්‍රව්‍යයන් වශයෙන් ඇති, අන්තැනක නිශ්චිතව සඳහන් කොට හෝ ඇතුළත් කොට නොමැති, සංයෝජන වර්ග (භාවිතයෙන් පසු ඉවතලන ලද තෙල් (වේස්ට් ඔයිල්)හැර ජෛවඩීසල් අඩංගු) : | | | |
| | | | | | | |
| | | --- | පැට්‍රෝල් | | | |
| | 2710.12.21 | ---- | ඔක්ටේන් අංක 92 සහිත පැට්‍රෝල් | | ලීටරයකට රු. 35.00 | කි.ග්‍රෑ. |
| | 2710.12.22 | ---- | ඔක්ටේන් අංක 95 සහිත පැට්‍රෝල් | | ලීටරයකට රු. 35.00 | කි.ග්‍රෑ. |
| | 2710.12.29 | ---- | අනෙකුත් | | ලීටරයකට රු. 35.00 | කි.ග්‍රෑ. |